**ශීර්ෂය - 248 සුරාබදු දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාම අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

---

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 7 (IV) ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණ ලෙස දක්වා ඇති රු.982,032,375 ක ශේෂයට සමාන ශේෂයක් ශුද්ධ වත්කම්/ප්‍රාග්ධනය යටතේ සංචිත වටිනාකමක් ලෙස දැක්විය යුතු වුවත් ඒ අනුව දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | පෙන්වා දීම නිවැරදිය. 2019 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සකස් කිරීමේදී දේපල, පිරියත හා උපකරණ ලෙස රු.982,032,375 ක සමාන අගයක් සංචිත ලෙස සටහන් කිරීමට කටයුතු කරමි. |
| (ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය පිළියෙල කිරීමේදී 2018 අයවැය ගත සංඛ්‍යා ද ඇතුලත් කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබු අවස්ථා විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. | පෙන්වා දීම නිවැරදිය. අතපසුවීමකින් එම සංඛ්‍යා දත්ත ඇතුලත් කිරීමට නොහැකි වූ අතර 2019 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සකස් කිරීමේදී එම සංඛ්‍යා ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

**1.6.2. ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(i)** මාසික සාරාංශ අනුව වෙනත් ලැබීම් රු.86,939,143 ක් වූ අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර සටහන් සමඟ සැසඳීමක් සිදු නොකර එය රු.243,586,169 ක් ලෙස දක්වා තිබුණි. | මාසික සාරාංශ පිළිබඳ අවධානය යොමු කිරීම හා ආදායම් ලැබීම් විශ්ලේෂණ වාර්තා සමඟ සැසඳීමට කටයුතු කල යුතුය. | නිරීක්ෂණ නිවැරදිය. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සැකසීමේදී වෙනත් ආදායම් ලෙස භාණ්ඩාගාර තැන්පත් ගිණුමේ හා තැගි අරමුදල් තැන්පත් ගිණුමේ ලැබීම් ඇතුලත් කර ඇත. නමුත් නිවැරදි ලැබීම් රු.86,939,143ක් බව සඳහන් කරමි. |
| (ii) ඉදිරිපත් කර තිබූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව සුරාබදු තැගි අරමුදලට සහ ක්ෂය සංචිත අරමුදලට ලද මුදල් එකතුව වූ රු.183,372,534 ක් වෙනත් ලැබීම් ලෙස වාර්තා කර තිබුණි. එහෙත් එම ගිණුම්වලට අදාලව තැන්පතු එකතුව වූ රු.465,068,138 ක මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. | නිරීක්ෂණ නිවැරදිය. ඉදිරියේ දී නිවැරදි ශේෂයට අනුව සකස් කිරීමට පියවර ගනිමි. |
| (iii) දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශ අනුව සහ හර නිවේදන ප්‍රකාරව භාණ්ඩාගාරයට කල මුළු ප්‍රේෂණය කිරීම් රු.113,741,682,208 ක් වූ අතර සැසඳීමකින් තොරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එය රු.113,590,225,124 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාරයට කළ මුළු ප්‍රේෂණය කිරීම නිවැරදිව ගණනය කල යුතුය. | පෙන්වාදීම නිවැරදිය. භාණ්ඩාගාරයට මුළු ප්‍රේෂණය කිරීම් රු.113,657,748,686 ක් විය යුතු බව පෙන්වා දෙමි. |
| (iv) මාසික සාරාංශ අනුව රු.86,939,142 ක් වූ වෙනත් ආදායම් මූල්‍ය කාර්ය සාධන | නිවැරදිව ගණනය කිරීම් කල යුතුය. | නිරීක්ෂණ නිවැරදිය. මූල්‍ය කාර්ය සාධන |

| | | |
|---|---|---|
| ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | | ප්‍රකාශන සකස් කිරීමේ දී මෙම ශේෂය අතපසුවීකින් ගිණුම්ගත කිරිමට නොහැකිවී ඇති අතර 2019 වර්ෂයේ ගිණුම් මගින් එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට නොපියවූ ගොඩනැගිලි කුලී අත්තිකාරම් ශේෂය රු.3,355,000 ක් වුවද එම වටිනාකම මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ කළවැඩ හා අත්තිකාරම් සංචිත ලෙස දක්වා නොතිබුණි. එමෙන්ම මෙය මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ACA-5 (බී) සටහනින්ද මගහැරී තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛණ ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. | පෙන්වාදීම නිවැරදිය. අතපසුවීමකින් ACA-5(බී) සටහනට ඇතුල් කිරීමට නොහැකි වූ බව දන්වා සිටින අතර, 2019 දී එම නොපියවූ ශේෂය පියවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.982,032,375 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එය රු.1,659,059,552 ක් වූයෙන් රු.677,027,177 ක වෙනසක් නිරීක්ෂණය විය. | ස්ථාවර වත්කම් ලේඛණය, උපලේඛණ, යවාත්කාලීන කල යුතුය. | නිරීක්ෂණ නිවැරදිය. දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු. 1,659,059,552 ක් වේ. එම නිවැරදි අගයන්ට අනුව 2019 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සකස් කිරීමේ දී ගණන් ගැනීමට සටහන් කර ගතිමි. |

**1.6.3.** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) කේවල ශේෂ වර්ගීකරණය තුළ හඳුනා නොගත් ශේෂයක් ලෙස රු.2,579,716 ක් ඇතුලත් කර තිබුණි. | හඳුනානොගත් ශේෂ මාසික සාරාංශ සමඟ සැසඳීම් කර හඳුනාගැනීමට පියවර ගත යුතුය. | හඳුනාගෙන පොත්වලට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 9 ගෙන් රු.783,684 ක මුදලක් අය වීමට තිබුණි. ඒ තුල වර්ෂ 5 ක් ඉක්ම වූ සේවකයන් 2 ගෙන් අයවිය යුතු රු.140,202 ක්ද වර්ෂ 3 ක් ඉක්මවූ සේවකයන් 3 කුගෙන් අයවිය යුතු රු.335,827 ක්ද වූ අතර මෙම මුදල් අය කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 ක වගන්ති ප්‍රකාරව කටයුතු කිරීම. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) දෙපාර්තමේන්තුවේ සේවය හැර ගිය, සේවයෙන් පහකර ඇති හා ඉල්ලා අස් වූ සේවකයන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.591,273 ක ණය ශේෂය වර්ෂ 6 සිට 10 දක්වා කාලයක් පැරණි, ශේෂ විය. එම ණය ශේෂ නිරවුල් කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**1.6.4.** තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශන අනුව තැන්පතු ලැබීම් හා ගෙවීම් වටිනාකම පිළිවෙලින් රු.226,519,053 ක් සහ රු.185,331,126 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එය පිළිවෙලින් රු.43,146,519 ක් සහ රු.34,337,939 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත අනුව සැසඳීම් කර නිවැරදි දත්ත ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. | නිරීක්ෂණ නිවැරදිය. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සැකසීමේදී තැන්පත් ගිණුමේ හා සුරාබදු තැගි තැන්පත් ගිණුමේ ලැබීම් හා ගෙවීම් ශේෂයන් සැලකිල්ලට ගෙන නැත. 2019 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සකස් කිරීමේදී ඇතුලත් කිරීමට සටහන් කර ගතිමි. |
| (ii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු.112,995,422 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂය රු.578,063,562 ක් විය. | භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සසඳා නිවැරදි ශේෂය සඳහන් කිරීමට කටයුතු කල යුතුය. | පෙන්වාදීම නිවැරදිය. තැන්පත් ගිණුම් ශේෂය 2019 වර්ෂයේ අවසාන ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.6.5.** අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.117,023,968 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.33,090,446 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සසඳා නිවැරදිව දැක්වීමට කටයුතු කල යුතුය | පෙන්වාදීම නිවැරදිය. දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර අග්‍රිම ශේෂය රු.117,023,968 ක් ලෙස දක්වා තිබුණද, දෙසැම්බර් 31 දින මුදල් පොත ශුන්‍ය කිරීම සඳහා රු.83,053,521.91 ක් හා රු.880,000 ක් හර නිවේදන (පිටපත් අමුණා ඇත) මගින් නැවත මහභාණ්ඩාගාරය වෙත ලබාදීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති රු.33,090,446 ක මුදල නිවැරදි බව සඳහන් කරමි. |

## 1.6.6. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) <u>ස්ථාවර වත්කම් ලේඛනය</u><br>1978 දෙසැම්බර් 17 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 17 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතුය. | මේ වන විට ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර ඇත. |
| (ii) <u>පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය</u><br>2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට අපේක්ෂා කරමි. |

### 1.6.7 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2019 මැයි 27 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 3,097 ක් විය. | විගණන විමසුම්වලට නොපමාව පිළිතුරු ලබාදීමට කටයුතු කල යුතුය. | ඉදිරියේ දී නියමිත දිනයට පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. |

### 1.6.8. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. එහෙත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතිය සකස් කිරීමට හා ඒ පිළිබඳව සමාලෝචනය කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |

## 1.6.9. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | | | |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br><br>මුදල් රෙගුලාසි 396 | 61,810 | නිකුත්කර මාස 6 ඉක්ම වූ එකතුව රු.61,810 ක් වූ චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | පෙන්වාදීම නිවැරදිය. මාස 6ක් ඉක්මවන ලද චෙක්පත් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2008 අප්‍රේල් 10 දිනැති අංක 1544/17 දරන ගැසට් නිවේදනයේ ඇතුළත් අංක 902 දරන සුරාබදු නිවේදනයේ iii උපලේඛණයේ 11 වන ඡේදයේ. | | විධිවිධානවලට පටහැනිව පළාත් 04 ක් සඳහා නියමිත සීමාව ඉක්මවා ර.බී.බලපත්‍ර 07 ක් ලබා දී තිබුණි. | ගැසට් නිවේදනයට අනුකූලව කටයුතු කල යුතුය. | මෙම බලපත්‍ර 07 පිළිබදව ඉදිරියේ දී වාර්තා කරමි. |

**1.6.10. අවිධිමත් ගනුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදී සිනමාශාලා සඳහා විනෝද පීඨිකා බලපත්‍ර (ර.බී.9) 38 ක් අලුත් කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණද එම බලපත්‍ර ස්ථාන සම්බන්ධයෙන් නියැදි විගණන පරික්ෂාවේදී පහත කරුණු නිරික්ෂණය විය. | | |
| (i) | පරිශ්‍රය සම්බන්ධයෙන් සපුරාලිය යුතු දුර ප්‍රමාණය අවස්ථා 18 ක දි සපුරා නොතිබීම. | සුරාබදු නිවේදන ප්‍රකාරව අදාල නීති රීති වලට අනුකූලව බලපත්‍ර නිකුත්කිරීම කල යුතුය. | පරිශ්‍රය සම්බන්ධයෙන් සපුරාලිය යුතු අවශ්‍යතා චිත්‍රපට සංස්ථාවේ නියාමනය මත සිදුවීම අපේක්ෂා කරන අතර ඒ සඳහා අවශ්‍ය උපදෙස් සහ දැනුම්දීම් දෙපාර්තමේන්තුව විසින් කරනු ලබයි. පවතින අඩුපාඩු චිත්‍රපට සංස්ථාව හා සාකච්ඡා කර ඉක්මනින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් මේ වන විටත් ලබාදී ඇත. |
| (ii) | සිනමාශාලාවල දර්ශන නරඹන්නන්ට හැර වෙනත් බාහිර පුද්ගලයන්ට අවස්ථා 7 ක දි මත්පැන් අලෙවි කිරීම. | සුරාබදු නිවේදන ප්‍රකාරව අදාල නීති රීති වලට අනුකූලව බලපත්‍ර නිකුත් කල යුතු අතර ඒවා කඩකරන්නන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය . | බලපත්‍ර කොන්දේසි කඩකිරීමක් සිදු වූ විට සුරාබදු ආඥා පනතේ 48 වගන්තියට අනුව කාර්මික අපරාධ වාර්ථාවන් ඉදිරිපත් කරයි. මෙම වරදවල් සුරාබදු ආඥා පනතේ 56 වගන්තිය අනුව සමථ කිරීමේ හැකියාව ඇති අතර ඒ අනුව සමථ ගාස්තු හා දඩ මුදල් අයකිරීම කරයි. සමථ ගාස්තු නොගෙවන විට බලපත්‍රය අත්හිටුවීම කල හැකිය. |
| (iii) | සිනමාශාලාවල දර්ශන ප්‍රදර්ශනය නොවන අවස්ථාවලදී පවා බලපත්‍ර කොන්දේසි කඩ කරමින් මත්පැන් අලෙවිය සිදුකර තිබුණු අවස්ථා 7 ක් නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය. බලපත්‍ර ලබා දීමේදි | බලපත්‍රයේ සඳහන් කොන්දේසි කඩකිරීම පිළිබඳව පරීක්ෂා කල යුතු අතර ඒවා කඩකරන්නන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය . | මෙම බලපත්‍ර සම්බන්ධව විශේෂයෙන් පරීක්ෂාකර අනාවරණය කරගෙන ඇති බලපත්‍ර ස්ථානවල කෙරෙන වරදවල් සම්බන්ධව බලපත්‍රධාරීන්ට එරෙහිව |

| | | | |
|---|---|---|---|
| | ඒ පිළිබඳව සොයා බැලීමකින් තොරව බලපත්‍ර ලබාදී තිබුණි. | | නීතිමය පියවර ගැනීමටත් එම තත්ත්වයන් නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් දී ඇත. |
| (iv) | සුරාබදු නිලධාරීන් විසින් බලපත්‍රලත් පාර්ශවයන්ගේ, ස්ථාන පිළිබඳ පරීක්ෂාවන් විධිමත්ව සිදුකරන බවට තහවුරුවක් නොමැති වීම. | බලපත්‍ර ලාභීන්ගේ ව්‍යාපාරික ස්ථාන පරීක්ෂාවට ලක් කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |

**1.6.11. මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- |
|---|---|---|---|
| (අ) | සුරාබදු ආඥා පනතේ 666 වැනි සුරාබදු නිවේදනයේ බලපත්‍ර කොන්දේසි අංක 12 ප්‍රකාරව බලපත්‍ර වෙන කෙනෙකුට පැවරිය නොහැකි බවත්, බලපත්‍ර කළමණාකරුගේ පත්වීම සුරාබදු කොමසාරිස්වරයාගෙන් කල් ඇතිව ලබාගත් අවසරයකින් තොරව වෙන කෙනෙකුට පැවරීම, බදු දීම හෝ පාලනය කිරීම සඳහා කිසිම නියෝජිතයෙකු පත් නොකළ යුතු බවත් දක්වා තිබුණි. එහෙත් සුරාබදු කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව එක් වයින් ස්ටෝර්ස් ආයතනයක් විසින් 2018 සැප්තැම්බර් 03 දිනැති අංක රහිත ලිපිය මඟින් මාසිකව රු.60,000 ක කළමනාකරණ ගාස්තුවක් අය කිරීම මත වෙනත් ආයතනයක් වෙතට එම බලපත්‍රයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට ලබාදී ඇති බව නිරීක්ෂණය විය. | සුරාබදු නිවේදන වල සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු සිදු කිරම හා එසේ සිදු නොකරන අවස්ථාවලදී විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2014 අප්‍රේල් 30 දිනැති අංක සුකොජ/පොදු/06/14 ලිපිය ප්‍රකාරව සෑම මාස තුනකට වරක් රා නිෂ්පාදනාගාරවලින් ලබා ගන්නා රා සාම්පල් රජයේ රස පරීක්ෂක වෙත යොමු කළ යුතු විය. එසේම දෙපාර්තමේන්තු නියෝග මාලාවේ IV පරිච්ඡේදයේ 12.2 ඡේදය පරිදි රා බෝතල් නිෂ්පාදනාගාරයභාරව කටයුතු කරන සුරාබදු නිලධාරීන්, නිෂ්පාදනය කරනු ලබන සෑම වාරයකදීම නිෂ්පාදන කටයුතු අවසන් වීමෙන් පසු බෝතල් කරන ලද රා බෝතල්වලින් නිදර්ශක ලබාගෙන එම නිදර්ශක රජයේ රස පරීක්ෂක වෙත යොමු | දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කිරීම කල යුතුය. | රා නිදර්ශක ලබා ගැනීමේ ක්‍රමානුකූල බවක් නොමැති බව පිළිගනිමි. එය නිවැරදි කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත |

| | | | |
|---|---|---|---|
| | කිරීමක් කළ යුතු විය. එහෙත් මාදම්පේ සුරාබදු බල ප්‍රදේශයේ වූ නිෂ්පාදනාගාර 6 ක නිදර්ශක ලබා ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී 2014, 2015, 2016 වර්ෂ වලදී වසරකට එක් වතාවක් බැගින්ද 2017 වර්ෂයේදී වාර 2 සිට 3 දක්වා අවස්ථා වලදී පමණක්ද සාම්පල් ගෙන තිබුණි. 2018 වර්ෂය වෙනුවෙන් 2018 ජුලි 24 දින වන විට එක් වතාවක්වත් සාම්පල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | පුද්ගලික රා සැපයුම්කරුවකුට දුම්මලසූරිය ඇක්මී ස්කාගාරයට රා සැපයීම සඳහා මිරිස්ලන්ද හේනවත්ත ඉඩමේ පොල් ගස් 2,847 ක් සහ එගොඩවත්ත ඉඩමේ පොල් ගස් 1,500 ක් මැදීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | 2018 ජුලි 26 දින සිදුකරන ලද ක්ෂේත්‍ර විගණන පරික්ෂාවේදී මිරිස්ලන්ද හේනවත්ත ඉඩමේ රා මැදීම සිදුකරනු ලබන ගස් සංඛ්‍යාව 500 ක් නොඉක්මවන බවත් එගොඩවත්ත ඉඩමේ රා මැදීම සිදුකරනු ලබන ගස් සංඛ්‍යාව 300 ක් නොඉක්මවන බවත් නිරීක්ෂණය විය. | අනුමැතිය ලබා දීමට පෙර ක්ෂේත්‍ර පරික්ෂාවක් සහ වෙනත් තොරතුරු මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු වල නිවැරදිතාවය තහවුරු කර ගත යුතුය . | රා මැදිම සඳහා අනුමැතිය ලබා දී ඇති ගස් ගණන අනුව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරනු ලබන අතර, විවිධ ප්‍රායෝගික හේතුන් මත අනුමත ගස් මැදීම මෙන්ම එම ගස් නොමැදීම සිදු කරනු ලබයි. කෙසේ වෙතත් රා මැදිමේ සිට රා ස්කාගාරයට ලැබෙන තෙක් සුරාබදු නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලබයි. |
| (ii) | එගොඩවත්ත මාදම්පේ යන ස්ථානයේ රා එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා CS අංක 18/2018 දරන අවසර පත්‍රයක් නිකුත් කර ඇතත් එවැනි රා එකතු කිරීමේ මධ්‍යස්ථානයක් එම ඉඩමේ ස්ථාපිත කර නොතිබුණි. | - එම - | පිළිතුරු ලබා දී නොමැත. |
| (iii) | 2018 ජනවාරි 29 දිනැති නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්ගේ (ආදායම්) අංක එල්බී/ස්ප්‍රීතු/ඇක්මී/දුම් දරන ලිපිය මගින් මෙම සැපයුම්කරුට පොල්ගස් 5000 ක රා ප්‍රමාණයක් , දෛනිකව දුම්මලසූරිය ඇක්මී ලංකා ස්කාගාරයට ප්‍රවාහනය කිරීම සඳහා (2018 දෙසැම්බර් 31 දක්වා) අනුමැතිය ලබා දී තිබුණි. | -එම- | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iv) | ඉහත සඳහන් කරුණු අනුව රා මැදීම සඳහා අනුමත කර ඇති ගස් සංඛ්‍යාව 4347 ක් පමණක් බවත්, ඉන් ගස් 3000 ක් පමණක් ඇක්මී ස්කාගාරයට රා මැදීම සඳහා බලපත්‍ර ලබා දී තිබුණි. සත්‍ය වශයෙන් ගස් 800 කට වැඩි නොවන ප්‍රමාණයක් රා මැදීම සඳහා යොදාගෙන තිබූ අතර ගස් 5000 ක රා ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.<br><br>ඒ අනුව ගස් 4,000 කට වැඩි සංඛ්‍යාවක් රා මැදීමකින් තොරව රා රැස්කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා අනුමත කිරීම පිළිබඳව විගණනයේදී මත භේදයට ලක්වන කරුණක් විය. | නිෂ්පාදන ධාරිතාවය හා සත්‍ය වශයෙන් මදිනු ලබන ගස් ප්‍රමාණය සැලකිල්ලට ගෙන ප්‍රවාහන බලපත්‍ර ලබාදීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | කවර හෝ වර්ගයක බලපත්‍රයක් ලබාදීමේදී සුරාබදු නිවේදන අංක 902 නිවේදනයේ iii වන උපලේඛණයේ සඳහන් මාර්ගෝපදේශ හා කොන්දේසි සපුරා ඇති බවට ඉල්ලුම් පත්‍රය හා ඇමුණුම්වල සඳහන් කරුණු සුරාබදු පරීක්ෂකවරයෙකු විසින් පරීක්ෂා කර නිරීක්ෂණ ඇතුළත් කලයුතු විය. ඉන්පසු සුරාබදු ස්ථානයේ ස්ථානාධිපති හෝ සුරාබදු අධිකාරී විසින් නිර්දේශ ඇතුළත් කළයුතු වේ. එහෙත් ජා ඇල සුරාබදු ස්ථානයේ බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීමේදී ඒ අනුව කටයුතු නොකර සුරාබදු ස්ථානාධිපති විසින්ම සියළු කටයුතු සිදුකර නිර්දේශ ලබා දී තිබූ අවස්ථා 15 ක් ද වයඹ පළාතේ එවැනි අවස්ථා 2ක්ද නිරීක්ෂණය විය. | සුරාබදු නිවේදනය සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු සිදු කිරීම හා බලපත්‍ර ලබාදීමේදී අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. | අනෙකුත් පරීක්ෂකවරුන් ග්‍රහන රාජකාරි, උසාවි රාජකාරි, බලපත්‍ර ස්ථාන පරීක්ෂා කිරීම් ආදි කටයුතුවල නිරතව සිටින විට ස්ථානාධිපතිවරයා විසින් බලපත්‍ර නිර්දේශ කරනු ලබයි. බලපත්‍ර ස්ථාන 120 ක් පමණ ඇති අතර, ඉන් 15 ක් ස්ථානාධිපතිවරයා විසින් සිදුකර ඇත. |
| (ඊ) | බලපත්‍ර අළුත් කිරීමේදී කාර්මික අපරාධ සම්බන්ධයෙන් නියම කර ඇති සමථ ගාස්තු නිරවුල් කර තිබීම අනිවාර්ය වුවද නියැදි විගණන පරීක්ෂාවට ලක්කල සුරාබදු ස්ථාන 3 කින් එසේ කටයුතු නොකළ අවස්ථා 27 ක් පැවති බව නිරීක්ෂණය විය. | සුරාබදු නිවේදනය සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූලික ඇස්තමේන්තු අනුව සුරාබදු (මත්පැන්) ආදායම රු.මිලියන 125,000 ක් වුවත් ඉදිරිපත් කර ඇති ආදායම් ප්‍රකාශය **(ACA–1)** අනුව සංශෝධිත ඇස්තමේන්තුව රු.මිලියන 115,000 ක් විය. එසේ සංශෝධනය කිරීමට අදාලව මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය. | මුදල් රෙගුලාසි 128(1)අ ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල කිරීම හා 2015 ජුලි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුගමනය කර ආදායම් පරිපාලනය වඩාත් කාර්යක්ෂමව ඉටු කල යුතුය. | මේ පිළිබඳ ව අවධානය යොමු කර ඇති අතර කමිටුවක් පත් කර අදාල විශ්ලේෂණ කටයුතු සිදු කරමින් පවති. විශ්ලේෂණ කටයුතු මසක කාලයක් ඇතුළත අවසන් කිරීමෙන් පසු අදාල වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූලික ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 125,000 ක් වූ අතර දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද ආදායම රු.මිලියන 113,850 ක් විය. එනම් ඇස්තමේන්තුගත ආදායමින් සියයට 91 ක් විය. | -එම- | -එම- |
| (ඇ) | 2016 වර්ෂයේ රු.බිලියන 120.2 ක් වූ සුරාබදු ආදායම 2018 වර්ෂය වනවිට රු.බිලියන 113.8 ක් දක්වා සියයට 5.3 කින් අඩු වී ඇති බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් බලපාන කරුණු පිළිබඳ විශ්ලේෂණය කිරීම සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කළමනාකරණය විසින් අවධානය යොමුකර ඇතිබවක් නිරීක්ෂණය නොවීය. | මෙම කාළය තුල මත්පැන් මත ඉතා ඉහළ බද්දක් පනවා ඇති තත්ත්වයක් තුල සුරාබදු ආදායම අඩු වී ඇත්තේ පරිභෝජනය අඩු වීම නිසාද එසේ නොමැතිනම් බදු නොගෙවා නීති විරෝධී ලෙස වෙළඳපලට මත්පැන් නිකුත් කළ හැකි මත්පැන් හේතුවෙන්ද යන්න පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට කටයුතු කල යුතුය. | පිළිතුරු සපයා නොමැත. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දින වන විට, සමාගම් 5 කින් වසර 5 ඉක්මවා තිබූ හිඟ බදු මුදල්වල | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව ආදායම් එකතු | වයඹ ඩිස්ටිලරිස් සමාගම, වයඹ ස්ප්‍රීතු |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.මිලියන 480 ක් වු අතර, ප්‍රමාද ගාස්තු එකතුව රු.මිලියන 1,543.78 ක් විය. එමෙන්ම සමාගම් 2 කට අදාළව නඩු පවරා තිබු අතර සමාගම් 3 ක් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කරන නිලධාරියා කටයුතු කලයුතු අතර, එම වගකීම පැහැර හැර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමට ඇති හැකියාව සොයා බැලීමට කටයුතු කල යුතුය. | ගබඩාව, ග්ලොබ් බ්ලෙන්ඩර්ස් සමාගම යන ආයතනයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති වෙත යොමුකර ඇත. |
| (ඉ) | හිඟ ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 176 (2) , (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | එකඟ වෙමි. |
| (ඊ) | 2015 ඔක්තෝබර් 22 දිනැති අංක ඊසී/සී/04/2015 දරන නිවේදනයට අනුව සී/ස හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගමෙන් අයවිය යුතු රු.මිලියන 50**.6** ක හිඟ බදු මුදල හිඟ ආදායම් තුල ඇතුලත්ව නොතිබුණි. එසේම රේගු නඩු අංක PCAD/HGO/029/2015/CCR/1952 දරන පරික්ෂණයට අනුව සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද පරික්ෂණයට අදාලව ඉහත සමාගමෙන් 2018 දෙසැම්බර් 31 දිනට තව දුරටත් අයවිය යුතු රු.මිලියන 108**.74** ක හිඟ බදු මුදලද ඇතුළුව එකතුව රු.මිලියන 158**.36** ක ලැබිය යුතු බදු මුදල් හිඟ ආදායම් යටතේ ඇතුලත්ව නොතිබුණි. | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව ආදායම් එකතු කරන නිලධාරියා කටයුතු කලයුතු අතර, එම වගකීම පැහැර හැර ඇති නිලධාරීන් වේ නම් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමට ඇති හැකියාව සොයා බැලීමට කටයුතු කල යුතුය. | සීමාසහිත හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම විසින් ගෙවිය යුතුව ඇති රු.50,620,739 ක මුදල මෙතෙක් ගෙවා නැත. තව ද, මෙම ආයතනය විසින් ගෙවිය යුතු රු.107,738,461 මුදල මාසිකව රු.15,391,208 ක් බැගින් ගෙවමින් පවතින අතර 2019 ජූලි 31 දින ගෙවා අවසන් වීමට නියමිතය. හිඟ ආදායම් යටතේ අවසාන ගිණුම් මඟින් පෙන්වීමට කටයුතු කරමි. |
| (උ) | 1999 අංක 8 දරණ දුම්කොළ බදු පනතේ 2 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම සිගරට්ටුවක්ම, සුරුට්ටුවක්ම, බීඩියක්ම සඳහා සහ සෑම පයිප්ප දුම්කොළ කිලෝග්‍රෑමයක් සඳහාම ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයන් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ඒ ඒ අනු ප්‍රමාණය අනුව වු බද්දක් පනවා අයකරනු ලැබිය යුතුය. එසේ වුවත් දෙපාර්තමේන්තුව විසින් දුම්කොළ බද්ද අය කරනු ලබන්නේ සිගරට් සඳහා භාවිතා කරන දුම්කොළ සඳහා පමණි. මේ අනුව දෙපාර්තමේන්තුව විසින් දුම්කොළ බදු පනතට අනුකූලව කටයුතු නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය. | පනතට අනුකූලව කටයුතු කල යුතුය. | බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය සෘජු අධීක්ෂණයකට ලක් කිරීම ප්‍රායෝගිකව අපහසුය. එම නිසා නිෂ්පාදිත ඒකක බද්දක් අය කර ගැනීම ප්‍රායෝගිකව ගැටළු සහගත බැවින් ඊට විකල්ප ක්‍රමවේදයක් ලෙස බීඩි හා සුරුට්ටු නිෂ්පාදනයට භාවිතා කරනු ලබන දුම්කොළ අමුද්‍රව්‍ය ප්‍රමාණය මත බද්දක් අය කර ගැනීමට යෝජිත දුම්කොළ බදු (සාමාන්‍ය) නියෝග |

සංශෝධනයේ දී ඇතුලත් කොට ඇත.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි අංක 50 ප්‍රකාරව විධිමත් ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා එක් වැය විෂයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.මිලියන 50 ක් ද , වැය විෂයයන් 10ක් සඳහා මු.රෙ. 66 මාරුකිරීම මඟින් රු.මිලියන 84.5 ක් ද ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. | ටෙන්ඩර් ප්‍රදානය කිරීමට අනුමැතිය නොලැබීම, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනට සමගාමී ව දෙපාර්තමේන්තුවේ විෂය පථය පුළුල්වීමත් සමග අමතර ක්‍රියාකාරකම් ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීම. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදුවීම. |
| (ආ) වැය විෂයයන් 16 ක් සඳහා එකතුව රු.මිලියන 639 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම වැය විෂයයන්ට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 252 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | එම | සැලසුම් කරන ලද පුහුණු අවස්ථා සඳහා නිලධාරීන්ට සහභාගිවීමට නොහැකිවීම, ප්‍රසම්පාදන කටයුතු සඳහා කාලය ප්‍රමාණවත් නොවීම. වවුචර්පත් නියමිත වේලාවට නොලැබීම, ගොඩනැඟිලි ඇස්තමේන්තු සැකසීමේ දී ප්‍රමාදවීම, වාහන අලුත්වැඩියා සිදු නොකර අපහරණය කිරීම, හේතුවෙන් ලබා ගත් ප්‍රතිපාදන ඌන උපයෝජනයක් සිදු වී තිබේ. |
| (ඇ) වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 317.6 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිඳු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | -එම- | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා නොගැනීම, මත්පැන් බෝතල් සඳහා අපේක්ෂිත ආරක්ෂිත ස්ටිකරයට අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම සහ බදු ගණනය සඳහා යෝජිත පරිගණක මෘදුකාංගය යොදා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු සූදානම් කිරීම සඳහා අනුමැතිය නොලැබීම යන කරුණු නිසා ප්‍රතිපාදන උපයෝජනය නොවීය. |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එකතුව රු.මිලියන 03 ක් වූ බැරකම් පිළිබඳ තොරතුරු අදාල ආකෘතියේ දක්වා නොතිබුණි. | සියලුම බැරකම් ගිණුම්වල දැක්විය යුතුය. | පෙන්වාදීම නිවැරදිය. මෙම බැරකම් ශේෂයන් ඉදිරිපත් කර ඇති අකෘතිය මගින් දැක්වීම මඟහැරී තිබූ අතර ඉදිරියේ දී මෙම තත්ත්වය නිවැරදි කිරිමට පියවර ගනිමි. |

**2.4** **තැන්පත් ශේෂයන්**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ සියළුම තැන්පත් රාජ්‍ය ආදායමට බැර කලයුතු වුවත් විවිධ තැන්පතු 46 කට අදාල එකතුව රු.මිලියන 4.7 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු සිදු කල යුතුය. | පෙන්වාදීම නිවැරදිය. 2019 වර්ෂයේ මැයි මස ගිණුම් සාරාංශය මගින් අදාළ තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආරක්ෂිත ස්ටිකර් සැපයීම හා ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් සැපයීම හා ස්ථාපිත කර පවත්වාගෙන යාම සඳහා වූ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු | රජයේ ආදායම සුරක්ෂිත වන පරිදි නියමිත කාල වකවානු තුල ව්‍යාපෘති ඉටුකිරීම කල යුතුය. | Fool proof ස්ටිකර් වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක කිරීමට ආසන්න ව සියයට 95ක පමණ වැඩ අවසන් කර ඇත. 2019 ජුනි 01 දින ආනයනික විදේශිය මත්පැන් |

| | | |
|---|---|---|
| වෙනුවෙන් රු.මිලියන 1.59 ක මුදලක් 2017 වර්ෂයේදී වැයකර තිබුණි. එසේම 2018 වර්ෂය සඳහා රු.මිලියන 250 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද 2019 විගණිත දින වන තෙක්ම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වි තිබුණි. | | බෝතල් සඳහා ද 2019 අගෝස්තු 01 දින සිට මෙරට නිෂ්පාදිත මත්පැන් බෝතල් සඳහාද මෙම ස්ටිකරය ඇලවීම සඳහා වූ අනුමැතිය ලබා ගැනීමටත් එය ගැසට් පත්‍රයේ එල කිරීම සඳහාත් රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මේ වන විටත් බාර දී ඇත. මේ අනුව ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කළ පසුව අදාළ දිනවල දී මෙම කාර්යය ආරම්භ කිරීමට නියමිත බව වාර්තා කරමි. |
| (ආ) බදු ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදිව කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ අයවැය ප්‍රතිපාදන මඟින් රු.මිලියන 18.6 ක්ද, 2017 වසරේදී පරිපූරක ප්‍රතිපාදන මඟින් රු.මිලියන 18.6 ක්ද, 2018 වසරේදී පරිපූරක ප්‍රතිපාදන මඟින් රු.මිලියන 50 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 87.2 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද 2019 වසර විගණිත දිනය වනතෙක්ම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. | බදු ගණනය හා එකතු කිරීම කාර්යක්ෂම කිරීම සඳහා යෝජිත මෙම ව්‍යාපෘතිය නියමිත කාල වකවානු තුල සිදු කල යුතුය. | දැනටමත් කල් ගතව ඇති සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතියක අත්‍යවශ්‍යතාවය හේතු කොට ගෙන මෙම පද්ධතිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. මේ අතරතුර අයවැය ප්‍රතිපාදන මගින් මුදල් වෙන් කරනු ලැබුව ද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අතරමග නැවැත්වීම හා ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කිරීම යන මූලික කරුණු පදනම්ව අදාළ ප්‍රතිපාදන භාවිතයට අවස්ථාවක් උද්ගත නොවිය. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාවේ ඇතුළත් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | | |
| (i) වාර්තාවේ 8.7 වගුව සහ 8.8 වගුව අනුව 2017 වර්ෂයේ ධාන්‍ය මත්පැන් (බීර) නිෂ්පාදනය තොග ලීටර් මිලියන 48 ක් ලෙස වාර්තා කර තිබුණද ආදායම් විශ්ලේෂණ වාර්තාවේ 8.20 වගුව මඟින් එය ලීටර් මිලියන 70 ක් ලෙස වාර්තා කර තිබුණි. | එක් එක් අංශ අතර මනා සම්බන්ධීකරනයක් පවත්වා ගනිමින් නිවැරදි වාර්තා ඉදිරිපත් කිරිමට කටයුතු කල යුතුය. | බදු ගණනය කිරීමේ ප්‍රතිපත්තිය, 2018 නොවැම්බර් 09 දින රාජ්‍ය අයවැය ප්‍රතිපත්තිය මත වෙනස් වීම නිසා මෙවැනි තත්ත්වයක් ඇති වී ඇත. |
| (ii) 2017 වර්ෂය තුළ පරිභෝජනය කරන ලද මත්පැන් ප්‍රමාණය පිළිබඳ "3A" වාර්තාව සැකසීමේදී වයින්, විදේශ මත්පැන්, අරක්කු සහ රා පිළබඳ අදාළ දත්ත නිවැරදි නොවන ලෙස දක්වා තිබුණි. | -එම- | ඒ ඒ බලපත්‍ර ලත් ස්ථානවලින් ලැබෙන දත්ත ලේඛනගත කිරීම, සාරාංශ ගත කිරීම හා ඒ මත පදනම්ව වාර්තා ඉදිරිපත් කරනු ලබන අවස්ථාවන්හි දී යම් වැරදීමක් සිදුවීමේ හැකියාවක් ද පවතී.<br>ඉදිරියේ දී Public Sector Efficiency Enhancement Programme ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ හඳුන්වා දීමට නියමිත Excise Revenue Management System පද්ධතිය වෙත පිවිස මාර්ගස්ථව එම දත්ත ලබා දීමේ හැකියාව බලපත්‍රධාරීන් වෙත ලබා දීමෙන් මෙම තත්ත්වය මගහරවා ගැනීමේ හැකියාව පවතී. |

| | | |
|---|---|---|
| (iii) දේශීය හා විදේශීය මාර්ගවලින් ලැබෙන එතනෝල් විවිධ කාර්මික නිෂ්පාදන සඳහා රටතුල භාවිතා වන අතර එතනෝල් ආනයනය කල ප්‍රමාණය, යොදාගත් කාර්මික නිෂ්පාදන ආයතන හා නිෂ්පාදන මොනවාද යන්න පිළිබඳ තොරතුරු වාර්ෂික කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වයට ඍජුව බලපාන තොරතුරු පිළිබඳව අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | 2017 කාර්ය සාධන වාර්තාවේ 8.7 පරිච්ඡේදය යටතේ කාර්මික නිෂ්පාදන බලපත්‍රධාරීන්ගේ නාම ලේඛනය ඇතුලත් කර ඇත. කාර්මික නිෂ්පාදන භාණ්ඩ විශාල ප්‍රමාණයක් ඇති බැවින් එම නිෂ්පාදන, කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කිරීම ප්‍රායෝගිකව සිදු කල නොහැකි බව වාර්තා කරමි. |

**3.3 ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>-------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- |
|---|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ අධීක්ෂණය සිදු කර එහි ඇති දූර්වලතා හා ප්‍රගතිය පිළිබඳව සොයා බලා ප්‍රමාදයන් ඇතොත් ඒ සම්බන්ධව හේතු විමසා ඒ සඳහා පිළියම් හා පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වුවත් ඒ අනුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2018 වසරේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 අනුව ප්‍රසම්පාදන සැලැස්ම ත්‍රෛමාසිකව අධීක්ෂණය කර සිදු කළ යුතු සංශෝධනයන් සිදුකර නොතිබුණු අතර, 2019 වසරේ ත්‍රෛමාසිකව හා අවශ්‍ය විට එම අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමටත් වරින් වර අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහාත් නිසි වැඩ පිළිවෙලක් යොදා ඇති බව කාරුණිකව දන්වමි. |
| (ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අනුගත වී නොතිබූ අවස්ථා 07 ක් විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ දී අපේක්ෂිත අරමුණු ඉටු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන සහ චක්‍රලේඛ විධිවිධාන සැලකිල්ලට ගෙන අදාල සැලසුම් පිළියෙල කල යුතුය. | 2019 වසරේ වාර්ෂික අයවැය සමඟ අනුගත වී ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි. |

**3.4** පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුත්තලම් දිස්ත්‍රික්කයට අයත් රා තැබෑරුම්, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ටෙන්ඩර් කර විකිණීම සඳහා ප්‍රසම්පාදනය ප්‍රසිද්ධ කර තිබුණද ඇතැම් රා තැබෑරුම් 2017 ජූලි 01 දින සිට 2018 ජූනි 30 දක්වා ටෙන්ඩර් මඟින් විකිණීම සිදුවී නොතිබුණි. මීට අමතරව රජයේ ඉහල තක්සේරුවට ගැලපෙන ලෙස ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් නොකිරීම නිසා පාලකුඩා අංක 03 රා තැබෑරුම හා දලුව රා තැබෑරුම් වෙන්දේසි කර නොතිබුණි. ඉදිරිපත් වූ ටෙන්ඩර්කරු වෙත එකී ටෙන්ඩරය ලබා දීමට කටයුතු නොකිරීම නිසා අදාල රා තැබෑරුම් ටෙන්ඩර් දෙකෙන් රජයට රු.මිලියන 3.5 ක මුදලක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී ගොස් තිබුණු බව නිරීක්ෂණය විය. | සිදුවිය හැකි පාඩු අවම වන අයුරින් කටයුතු සිදු කල යුතුය. | රා තැබෑරුම් රේන්ද විකිණීම රා තැබෑරුම් ටෙන්ඩර් කිරීම සම්බන්ධ සියලුම කටයුතු සිදු කරනු ලබන්නේ අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ වන අතර, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා ද ප්‍රාදේශීය ලේකම් වේ. එකී රා තැබෑරුම් සඳහා වත්කම් සහතික හා මුදල් අයකර ගැනීම, නැවත ටෙන්ඩර් කිරීම ප්‍රාදේශිය ලේකම්රගේ වගකීමක් වේ. වාර්ෂික ටෙන්ඩර් ගාස්තුව නියම කිරීම හා රා තැබෑරුම් සඳහා ගොඩනැගිලි අනුමත කිරීම, රා තැබෑරුම බලපත්‍රය පිරිනැමීමෙන් පසුව රා තැබෑරුමේ රා අලෙවිය සම්බන්ධ අධීක්ෂණය කිරීම පමණක් සුරාබදු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ. |
| (ආ) | කිලිනොච්චි තල් හා පොල් සම්පත් සංවර්ධන සමුපකාර සමිතිය විසින් වාර්ෂිකව නිෂ්පාදනය කරන ලද රා බෝතල් වෙනුවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට නියමිත බදු මුදල් ගෙවිය යුතුය. නමුත් 2017 වර්ෂය දක්වා ආදාල සමිතිය රා බෝතල් (625 ml) 2,266,790 ක් නිෂ්පාදනය කර ඇති බවට වාර්තා වි තිබුණද බෝතල් 1,073,955 කට පමණක් බදු මුදල් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව රා බෝතල් 1,192,835 ක් වෙනුවෙන් අයවිය යුතු රු.7,814,693 ක බදු මුදල් ගෙවා ඇති බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව ආදායම් එකතු කරන නිලධාරීයා කටයුතු කලයුතු අතර එම වගකීම පැහැර ඇති නිලධාරීන් වේ නම් ඔවුන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡෙදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය. එසේම දෙපාර්තමේන්තුවට අහිමි වූ ආදායමක් වේ නම් එය අයකර ගැනීමට කටයුතු කල යුතුය. | දෙපාර්තමේන්තු පොත් අනුව ගෙවිය යුතු හිඟයක් පෙන්නුම් නොකරන අතර තව දුරටත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව වාර්තා කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂයන්හි දි සිදු වී ඇති වාහන අනතුරු 7 ක් සම්බන්ධයෙන් රු.මිලියන | මු.රෙ. 104 ප්‍රකාරව අලාභය අයකර ගැනීමට | හානි පාඩු ලේඛනයට ඇතුළත් කර භාණ්ඩාගාර අනුමැතිය මත |

| | | | |
|---|---|---|---|
| | 1.8 ක අලාභ 2019 වර්ෂයේ විගණිත දින විටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට විධිමත් පියවරක් ගෙන නොතිබූ අතර ඒ පිළිබඳව පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ කිසිදු සටහනක් ඇතුළත් කර නොතිබුණි. | කටයුතු කිරීම හෝ කපා හැරීමට විධිමත් පියවර ගැනීම සිදු කල යුතුය. | ගිණුම්වලින් කපා හැරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් උපදෙස් ලබා දී ඇති බැවින් ඉදිරියේදී එසේ කිරීමට කටයුතු කරන බවට කාරුණිකව දන්වමි. |
| (ඈ) | හිඟුරාන ඩිස්ටිලරීස් සමාගම විසින් 2012, 2013 සහ 2014 වර්ෂයන්හිදී නීති විරෝධී ලෙස ආනයනය කළ එතනෝල් ස්ප්‍රීතු ලීටර් 218,600 ක් භාවිතා කර නිෂ්පාදනය කල මධ්‍යසාර සම්මත සැර ලීටර් 842,990 ක් සුරාබදු ගෙවීමකින් තොරව වෙළඳසැල්වලට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අයකළ යුතු සුරාබද්ධ දළ වශයෙන් රු.මිලියන 1,635 ක් පමණ විය. මේ සඳහා පත්කල කමිටුව විසින් නිවැරදි නොවන පදනමක් මත ස්ප්‍රීතු සම්මත සැර බවට පරිවර්තනය කිරීම හේතුවෙන් අයකළ යුතු සුරාබද්ධ රු.මිලියන 589 ක් ලෙස වාර්තා කර තිබුණි. මෙම ගණනය කිරීම හේතුවෙන් රු.මිලියන 1,046 ක පමණ මුදලක් රජයට අහිමි වී ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කල නොහැකි විය. | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව ආදායම් එකතු කරන නිලධාරීයා කටයුතු කලයුතු අතර එම වගකීම පැහැර ඇති නිලධාරීන් වේ නම් ඔවුන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය . | මත්පැන් සැපයුම්දාමය ආශ්‍රිත ක්‍රියාවලිය සම්බන්ධයෙන් මෙන්ම මත්පැන් නිෂ්පාදනය ආශ්‍රිත තාක්ෂණික ක්‍රියාදාමය සම්බන්ධයෙන් ද දැනුම හා පලපුරුද්ද සහිත දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් රේගු පරීක්ෂණයෙහි දී වග උත්තරකරුවන් විසින් කරන ලදැයි ඉදිරිපත් වූ ප්‍රකාශ මත පමණක් පිහිටා උපරිම තාර්කිකභාවයකින් යුතුව අදාළ ගණනය කිරීම් සිදු කොට රජයට බදු ආදායමක් ලබා දීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. |
| (ඉ) | මෙම නිෂ්පාදන පරිශ්‍රය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් ස්ථාපිත කර නිලධාරීන් අනුයුක්ත කර අධීක්ෂණ කටයුතු පවරා තිබියදීත් වර්ෂ කිහිපයක් තිස්සේ මෙවැනි නිතීවිරෝධී නිෂ්පාදනයන් සිදුකිරීම හා ඒවා වෙළඳපොලට නිකුත් කිරීම අනාවරණය නොවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමට අදාල කමිටුව විසින් හෝ වෙනත් පාර්ශවයක් විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | -එම- | සුරාබදු නිලධාරියකුට එරෙහිව චෝදනා නැගීමට ප්‍රමාණවත් සාක්ෂි සොයා ගෙන නොමැති බව පෙනී යයි. මෙහි දී ද නැවතත් අවධානයට ගත යුතු වන්නේ එතනෝල් නැතහොත් නිෂ්පාදිත මත්පැන් බිඳකුදු සොයා ගැනීමකින් තොරව හුදෙක් සේවක ප්‍රකාශ දෙකක් මත පදනම්ව රේගු පරීක්ෂණය මෙන්ම සුරාබදු පරීක්ෂණය ද සිදු කර ඇති බවත්, සුරාබදු දෙපාර්තමේන්තුවේ ස්ථාවරය නිරන්තරයෙන්ම වගඋත්තරකාර සමාගමේ අභියෝගයට ලක් කරන ලද බවත්ය. |

**3.5** **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුරාබදු ස්ථාන හා විශේෂ මෙහෙයුම් ඒකකය පාලනය සඳහා වන රෙගුලාසිවලට අනුව සහකාර සුරාබදු කොමසාරිස් හා සුරාබදු අධිකාරීවරුන් විසින් තම පාලනයට යටත්ව පවතින සුරාබදු ස්ථාන ත්‍රෛමාසික හා අර්ධ වාර්ෂිකව පරීක්ෂාකළ යුතු වුවත් වසරකට පරීක්ෂා කරනු ලබන වාර සංඛ්‍යාව 2 කට පමණක් සීමාවීම හේතුවෙන් අධීක්ෂණ කටයුතු දුර්වල මට්ටමක පැවතුණි. (උදාහරණ :- ජා ඇල, වයඹ පළාත, සිනමාශාලා, ර..බී.9 බලපත්‍රලත් ස්ථාන) | දෙපාර්තමේන්තු නියෝගවලට අනුව අදාල අධීක්ෂණ කටයුතු නියමිත පරිදි සිදු කිරීම තුලින් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට කටයුතු කල යුතුය . | සුරාබදු බලපත්‍ර ලත් ස්ථාන පරීක්ෂා කිරීම අවම වශයෙන් මාසික පදනම යටතේ සිදු කළ යුතු බවට නියම කර ඇතත්, සැක සහිත හෝ එසේ කිරීමට අවශ්‍ය බව හැඟෙන අවස්ථාවන්හි දී බලපත්‍රලත් ස්ථාන පරීක්ෂා කිරීමට සුරාබදු නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. කෙසේ වුව ද, විගණනයේදී හෙළිදරව් වූ කරුණු පදනම්ව මින් ඉදිරියට වඩාත් කාර්යක්ෂම අධීක්ෂණයක් බලපත්‍ර ලත් ස්ථාන සම්බන්ධයෙන් පවත්වා ගැනීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් අවසන් වරට 2016 දෙසැම්බර් 30 දින බ්‍රිටෙක්ස් කි.ග්‍රෑම් 100 ක් මිලදී ගෙන තිබුණු අතර 2018 දෙසැම්බර් 17 දින වන විට ගබඩාවේ තොග අවසන්ව තිබුණි. 2018 ජුනි 05 දින ගබඩා භාරකරු විසින් ගබඩාවේ ඇති තොගය කි.ග්‍රෑම් 22.250 ක් බවත් එය මාස 5 කට පමණක් ප්‍රමාණවත් වන හෙයින් අවශ්‍ය තොග ලබාදෙන ලෙස පරිපාලන නිලධාරී (සැපයුම්) හරහා ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉල්ලීම් කර තිබුණි. මේ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම 2018 ජුනි 14 දින සිට ආරම්භ කර තිබුණ ද 2019 අප්‍රේල් 09 දින වනවිටත් අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් වී නොතිබුණි. | නියමිත කාලවකවානුව තුල ඉටුකිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුලත ඉටුකිරීමට කටයුතු කිරිම තුලින් රාජ්‍ය ආදායමට සිදුවිය හැකි අහිතකර බලපෑම අවම කිරීමට කටයුතු කල යුතුය. | මේ වන විට මිල දී ගැනීම් සිදු කර ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ලඟාකර ගත යුතු අරමුණු සහ ඉලක්ක කරා ලඟා වීම පිළිබඳ දෙපාර්තමේන්තුව දැනුවත්ව නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කිරීමට කටයුතු සිදුකර නොතිබුණි. | අරමුණු හඳුනාගෙන ඉලක්ක කරා ලගාවීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරිම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. | එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමටත් එම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ඉදිරියේ දී ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරමි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුවේ මෙහෙවරට සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ සහ තෘතියික මට්ටම් වල තනතුරු 83 ක් 2013 සහ 2016 වර්ෂවල සිට පුරප්පාඩුව පැවතුණි. මෙය දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | අවශ්‍යතා සැලනිල්ලට ගෙක අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කිරීම හෝ අතිරික්ත තනතුරු වේ නම් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගැනීමට කටයුතු කල යුතුය. | පිළිතුරු ඉදිරිපත් නොවීය. |
| (ආ) දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ලෙස කටයුතු කළ නිලධාරියෙක් ආදායම් ප්‍රතිපත්ති උපදේශකවරයෙකු ලෙස 2017 සැප්තැම්බර් මස මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අතර එදින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා සියළු දීමනා සහිතව වැටුප් ලෙස රු.මිලියන 03 ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. උපදේශක තනතුරේ රාජකාරී කිරීමට අදාළ කාර්ය සාධන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවීය. | අදාල කාර්යසාධන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | පිළිතුරු ඉදිරිපත් නොවීය. |